# 25
# කමාවේ ජීවිත

මතෙව් 18 : 21 36 , එපීස 4 : 25 29

**"අපට වරද කළ අයට අප කමා කළාක් මෙන් අපේ වරදට අපට කමා වුව මැනව." (මතෙව් 6 :12 )**

මෙය දිනපතා අප කවුරුත් යදින ස්වාමීන්ගේ යාච්ඤාවේ වගන්තියක් බව ඔබට වැටහෙනු ඇත. කමාව ලැබීමට කමාව පිදිය යුතුය යන ද්විත්ව අන්තර්ගතයක් මෙහි ඇතුළත් බව පැහැදිලි ය. ලොව වෙසෙන නිතර වරදට පාපයට පෙළඹෙන අප සැමට කමාව ඉතා වැදගත් ය. වැරදි කළ සැම විට කමාව ද අපේක්ෂා කරයි. එමෙන්ම එය අගය කරයි.

මුළු මිනිස් සංහතිය නිරත පාපයට නැඹුරු වන වැරදි කරන අය වේ. දෙවියන් වහන්සේ සතහට කරුණාව පාමින් මුලින් ම ආදී පියවරු මඟින් ද පසුව දිවැසිවරු මඟින් ද ජනතාව යහ මඟට ගෙන ඒමට උත්සාහ දරමින් පියවර ගත් සේක. එහෙත් එම අවවාද නොතකා ක්‍රියා කළ මනුෂ්‍යයා හට උන්වහන්සේ කොපමණ ප්‍රේම කළේ ද යත් තම පුත්‍රයාණන් වහන්සේ ලොවට දෙවා වදාළේ අපේ පව්වලින් ගලවා කමාව ලබා දීමට ය.

පාප රහිත ජේසුස් වහන්සේ කුරුසිය මත දිවිපුදා අපට සදහට කමාව දානය කිරීමට කුරුසියේ මඟ තෝරා ගත් සේක. කිතුනු අපි එම කමාව යැදීමට ලැබීමට උරුමක්කාරයෝ වෙමු.

කමාව ලැබීමට ඇති වැදගත් පදනම කුමක් ද? වරද ගැන පසුතැවිල්ල පශ්චාත්තාප වීම ය. ස්නාවක ජොහාන් තමා වෙත පැමිණි ජනතාවට යෝර්දාන් ගඟ අසබඩ දී කීවේ කුමක් ද? තම තමාගේ හා කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ වැරදි පාපයන් ගෙන්වා දෙමින් පාශ්චාත්තාප වී බෞතිස්ම වීමට ය.

ජේසුස් වහන්සේ තම ඉගැන්වීම්වලින් කමාව ලැබීම ගැන පවසා ඇත්තේ කුමක් දැ යි සලකා බලමු. ලූක් 15 : 11 සිට ඇති නැති වූ පුත්‍රයා පිළිබඳ උපමා කථාව ය. බාල පුත්‍රයා නොමඟ ගිය ද පසු ව තම වරද ගැන කණගාටු විය. පශ්චාත්තාප විය. තම පියාට හා නිවහනට පිටුපා ගිය පුත්‍රයා ආපසු පැමිණියේ ඉතා යටහත් පහත් ව තම නොවටිනාකම කියා පාමින් කමාව යැදීමට ය. පියා පිළිගත්තේ ඉමහත් හරසරින් ය. කමාව පිදීමෙන් ය. මෙයින් දේව රාජ්‍යයේ උතුම් ගුණාංගයක් ගෙන හැර පා ඇත. මෙම උපමා කථාව මඟින් පසුතැවිලි වී මනසථාපනයෙන් කමාව යැදීම, එවිට කමාව පිදීමත් යන්න පැහැදිලි ව

ඉදිරිපත් කරයි. පසුතැවිලිවීමෙන් වරද කළ පුද්ගලයා තුළ ජීවිත වෙනසක් ඇති වූ බව ද පනේවා දෙයි. වරද පාපය නිසා මිනිසාගේ වැටීම නිසා ජීවන ගමන නවතින්නේ නැත. කමාව හා මනස්ථාපනය.




එම වරදින් නැගී සිටීමටත් ජීවිතයේ ඉදිරියට යෑමටත් අවස්ථා සලසන බව පෙනී යයි.

**- සිතන්න -**

- ඔබ මේ සතිය තුළ දී කළ වැරදි මොනවා ද?
- ඒ ගැන ඔබ මනස්තාපනය වූයේ ද?
- කමාව යැදුවේ ද? කැඩුණු සබඳතා ගොඩ නඟා ගැනීමට ක්‍රියා කළේ ද?
- කමාව පතා දෙවිපියාණන්ට යාච්ඤා කළේ දැ යි මෙනෙහි කරන්න.

අප සමාව බලාපොරොත්තු වන්නා සේ ම අපට වරද කළ අයට සමා වීම ද ඉතා ම වැදගත් බව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලින් ද ස්වාමින්ගේ යාච්ඤාවෙන් ද ස්ථිර ව පෙන්වා දී ඇත.

**- කමාවීම -**

මීළඟට සිතා බැලිය යුත්තේ ඔබට යම් කෙනෙකු වරදක්

- කළා ද? එය කුමක් ද?
- ඔබ ඒ පුද්ගලයාට හෝ ඒ අයට කමා වූයේ ද?
- ඔබ යාච්ඤාවෙන් එම පුද්ගලයා උදෙසා දෙවි පියාණන්ගෙන් කමාව යැදුවේ ද?

එක් විටක දී ජේසුස් වහන්සේගේ ගෝලයෙක් වන පේදුරු ප්‍රශ්න කළේ තමාට වැරදි කරන සහෝදරයාට සත්වරක් දක්වා කමා වීම සුදුසු ද කියා ය. උන්වහන්සේගේ පිළිතුර වූයේ "සත්වරක් නොව සත්වර සැත්තෑවකැයි" කියා ය. සීමා රහිත ව කමාවේ වැදගත්කම ජේසුස් වහන්සේ පේදුරුට එදා පැවසුවා සේ ම කිතුනු අපට අභියෝග කරන්නේ ද සීමාරහිත ව කමාව පිදීමට ය.

මෙලෙස කමාවීමේ වැදගත්කම පෙන්වා දීමට ජේසුස් වහන්සේ කමා නොවූ දාසයා ගැන උපමාවක් ඉදිරිපත් කළ සේක. මතෙව් 18 : 23 සිට කියවා බලන්න. විශාල ණය බරකින් සිටි දාසයෙක් තම ස්වාමියා වෙත ගොස් එම ණය ගැන ඉවසා කමාවීමට ස්වාමියාගේ යැදුවේ ය. ස්වාමියා ද අනුකම්පා කර ඔහු ණය බරින් නිදහස් කොට කමා වූ බව කියවේ.

එහෙත් පසු ව සිදුවුයේ කුමක් ද? මෙම දාසයාගෙන් සුළු ණයක් ලබා ගත් වෙනත් කෙනෙකු විය. මොහු කමාව ලැබුව ද සුළු ණය හිමියාට අනුකම්පා කර කමා වුයේ නැත. ණය ගෙවන තෙක් සිරභාරයට ගන්නා ලදී. මේ ගැන අසා කෝප වූ ස්වාමියා ඔහුට පැවසුවේ සහකාර දාසයාට කමා වී ණය නිදහස් කරන්ට තිබුණා නොවේ ද කියා ය. එසේ නොකළ බැවින් ඔහුට දඩුවම් කරන ලදී. කමාව ලබන තැනැත්තා කමාව පිදීමටත් යොමු විය යුතු බව ජේසුස් වහන්සේ මෙම උපමා කථාව අවසානයේ දෙන අනුශාසනය යි.
ඒ ගැන සිත් යොමු කරන්න.

**"ඔබත් එකින් එකා තමාගේ සහෝදරයාට මුළු සිතින් කමා නොකරන්නාහු නම් ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ ද එසේ ම ඔබටත් කමා නොකරනු ඇත." යනුවෙනි.**

කමාව අප කාහටත් අවශ්‍ය, බලාපොරොත්තු වන ගුණාංගයකි. එහෙත් එය ලැබීමට කොන්දේසි ඇති බව ඉහත පාඨයෙන් ද ස්වාමින්ගේ යාච්ඤාවෙන් ද ඉදිරිපත් කර ඇත. එනම් අප ද අපට වරද කරන අයට එලෙස ම කමා විය යුතු බව ය.

පාවුල් තුමා එපීස වාසීනට ලියන ලද යැවුම් පත්‍රයේ පවසා ඇත්තේ " ඉර බසින තුරු හිතේ කෝපය තබා නොගන්න" කියා ය.

සමාජයක් වශයෙන් ද කිතුනුවන් මෙසේ කමාව පිදීමෙන් ක්‍රියා කිරීම අපේක්ෂිත ය. ක්‍රෝධය, වෛරය, පළිගැනීම ඉස්මතු ව ඇත්තේ කාමාවීමේ සිතක් නොමැති නිසා ය. අප රටේ අපේ සමාජයේ අද අසන්නට ලැබෙන දරුණු අපරාධවලට මුල කමාව ගිලිහී යෑම නොවේ ද? යුද්ධමය වාතාවරණයට මුල් වූ කරුණු ද පළිගැනීමේ චේතනාව මුල් වීම යි.

"දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළින් ඔබට කමා කළාක් මෙන් ඔබත් එකිනෙකාට කමා කරන්න." කිතුනු අප නිරන්තරයෙන් මෙම ශික්ෂණයේ පිහිටමු. එවිට අපි වෙසෙන නිවාස සමාජය, පරිසරය, මේ පුංචි ලංකාව හා ලෝකයත් යහපත් තැනක් වනු නියත ය. දේව රාජ්‍ය මිහි පිට ව්‍යාප්ත වනු සහතික ය.

❖ **ඇගැයීම :-**

1. කුළල් කා ගැනීම, ක්‍රෝධය, පළිගැනීම වැනි අයහපත් චේතනා ඉස්මතු වී සමාජය පරිහානිය කරා ඇදගෙන යනුයේ "කමාව" මිනිස් සිතින් ගිලිහී යෑම නිසා ය. අප සමාජයෙන් උදාහරණ දෙමින් පහදන්න.
2. ස්වාමින් වහන්සේගේ යාච්ඤාව යදින අවස්ථාවේ දී මදක් නිශ්චල වී ඔබට වරද කළ අයට කමා වූයේ දැ යි සිතා බලන්න.